# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2295/43 – 2022 සැප්තැම්බර් 02 වැනි සිකුරාදා – 2022.09.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උපවගන්තිය යටතේ, සංචාරක හා ඉඩම් අමාත්‍ය, නාලක ජූඩ් හරින් ප්‍රනාන්දු වන මම මෙයින් ප්‍රකාශ කරමි.

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උඩපොල මැදලස්ස කෝරළේ සුළු කොට්ඨාසයේ අංක 903, පොතුහැර බටහිර ග්‍රාමනිළධාරී කොට්ඨාසයේ පොතුහැර ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක KU/PLG/2019/576 හා 2020.09.04 දිනැති ප්‍රගමන අනුරේඛණයේ සවිස්තරව දක්වෙන පහත සඳහන් නමින් හා ප්‍රමාණයෙන් යුක්ත ඉඩම් කොටසට මායිම්:

01. කැබලි අක්ෂර **A – කඩේවත්ත බුළුගහමුලවත්ත නොහොත් බුළුගහවලේවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0164 ක් පමණ**

උතුරට: කාණුව සහ මාර්ගය; නැගෙනහිරට: මාර්ගය; දකුණට: මාර්ගය; බටහිරට: කාණුව.

**හරින් ප්‍රනාන්දු,**
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 4-3/9/2019/S/521
2022 ජුනි මස 30 වැනි දින,
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

EOG-09-0022